**ශීර්ෂය 196 - විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශය පිළිබඳ විගණකාධිපති වාර්තාව 2015 වර්ෂය**

ශීර්ෂය 196 - විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශයේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මුල්‍ය වාර්තා, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාත්‍රාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2016 නොවැම්බර් 04 දින අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනිම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරිම් මත පදනම් වි ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

## 1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකිම

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මුල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරිම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරිම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකිම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරිම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරිමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරිම, ක්‍රියාත්මක කිරීම හා පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

## 2. ගිණුම්

## 2.1 විසර්ජන ගිණුම

**මුළු ප්‍රතිපාදනය හා වියදම**

අමාත්‍යාංශය සඳහා සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.මිලියන 3,756.90 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.මිලියන රු.3,148.13 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු.මිලියන 608.77 ක් හෙවත් සියයට 16.20 ක ප්‍රතිපාදන ඉතිරි වි තිබුණි. විස්තර පහත දැක්වේ.

| **වියදම** | **2015 දෙසැම්බර් 31දිනට** | | | **ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස** |
|---|---|---|---|---|
| | **ශුද්ධ ප්‍රතිපාදනය** | **උපයෝජනය** | **ඉතිරිය** | |
| | **රු.මිලියන** | **රු.මිලියන** | **රු.මිලියන** | |
| පුනරාවර්තන | 1,500.35 | 1,425.78 | 74.57 | 4.97 |
| මුලධන | 2,256.55 | 1,722.35 | 534.20 | 23.67 |
| **එකතුව** | **3,756.90** | **3,148.13** | **608.77** | **16.20** |

**2.2 අත්තිකාරම් ගිණුම**

**රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම**

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

අමාත්‍යාංශයට අදාළ විෂය අංක 19601 යටතේ රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ .

| වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|
| **උපරිම සීමාව** | **තථ්‍ය** | **අවම සීමාව** | **තථ්‍ය** | **උපරිම සීමාව** | **තථ්‍ය** |
| රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| 20.00 | 19.47 | 0.50 | 17.85 | 75.00 | 58.18 |

**2.3 අග්‍රිම ගිණුම**

අමාත්‍යාංශය යටතේ වන අංක 7002/0000/0292/0015/000 දරන අග්‍රිම ගිණුමේ 2015 දෙසැම්බර් 31 දිනට ශේෂය රු.මිලියන 41.90 ක් විය..

**2.4 පොදු තැන්පත් ගිණුම**

අමාත්‍යාංශය යටතේ වන පොදු තැන්පත් ගිණුම් 03 ක 2015 දෙසැම්බර් 31 දිනට ශේෂවල එකතුව රු.මිලියන 6.39 ක් විය. විස්තර පහත දැක්වේ.

| **තැන්පත් ගිණුම් අංකය** | **2015 දෙසැම්බර් 31 දිනට ශේෂය** |
|---|---|
| | රු.මිලියන |
| 6000/0000/00/0001/0126/000 | 0.36 |
| 6000/0000/00/0002/0175/000 | 0.02 |
| 6000/0000/00/0016/0122/000 | 6.01 |
| **එකතුව** | **6.39** |

**2.5 විගණන නිරීක්ෂණය**

විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශයේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ඉහත 1.1 ඡේදයේ දක්වා ඇති කළමනාකරණ විගණන වාර්තාවේ සඳහන් විගණන නිරීක්ෂණවලට යටත්ව සතුටුදායක ලෙස පිළියෙල කර තිබුණි. එම කළමනාකරණ විගණන

වාර්තාවේ ඇතුළත් විගණන නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ 3 ඡේදයේ සඳහන් කර ඇත.

**3. ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ**

**3.1 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම**

1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය ප්‍රකාරව ස්ථාවර වත්කම් ලේඛනය පවත්වා නොතිබුණි.

**3.2 විසර්ජන ගිණුම**

**3.2.1 අයවැය විචලනය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) වැය විෂයයන් 07 ක් සඳහා සලසා තිබුණු එකතුව රු.මිලියන 21 ක මුළු ශුද්ධ ප්‍රතිපාදනයම උපයෝජනය නොකර ඉතිරි කර තිබුණි.

(ආ) වැය විෂයයන් 76 ක් සඳහා අධි ප්‍රතිපාදන සලසා තිබීම හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය එම වැය විෂයයන්ට අදාළ ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 17 ක සිට සියයට 99 ක් දක්වා පරාසයක ප්‍රමාණයක් වී තිබුණි.

**3.3 අග්‍රිම ගිණුම්**

2005 වර්ෂයේ සිට පැවැත එමින් තිබුණු රු.මිලියන 14.34 ක අග්‍රිම ශේෂය 2016 අප්‍රේල් 30 දින වන විටත් පියවා නොතිබුණි.

**3.4 පොදු තැන්පත් ගිණුම**

වර්ෂ 2 ක් ඉක්ම වූ රු. 2,400,000 ක් වූ තැන්පතුවක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

**3.5 යහපාලනය හා ගිණුම් කටයුතුභාවය**

**3.5.1 වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම**

රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය අනුව කටයුතු කර භාණ්ඩ හා සේවා ලබා ගැනිමට වාර්ෂික අයවැය ඇස්තමේන්තුව මගින් රු.මිලියන 130 ක ප්‍රතිපාදන පාර්ලිමේන්තුව විසින් අනුමත කර තිබුණි. එසේ වුවත් ප්‍රසම්පාදන සැලැස්ම මාස 06 කට වැඩි කාල පමාවකින් පසුව 2015 ජූලි 22 දින අනුමත කර

තිබුණි. ඒ නිසා සැලැස්මෙන් අපේක්ෂිත අරමුණු ඉටු කර ගැනීමට නොහැකි වී තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ ප්‍රසම්පාදන සැලැස්ම අනුව මිලදී ගැනීමට සැලැසුම් කළ භාණ්ඩ අතරින් රු.37,524,500 ක් වටිනා භාණ්ඩ අයිතම් වර්ග 36 ක් මිලදී ගෙන නොතිබුණි. ප්‍රසම්පාදන සැලැස්මෙන් බැහැරව රු.1,388,164 ක් වටිනා භාණ්ඩ අයිතම් වර්ග 14 ක් මිලදී ගෙන තිබුණි.

(ආ) අමාත්‍ය කාර්යාලයේ මිලදී ගැනීම් සඳහා රු.මිලියන 2.00 ක් අනුමත කර තිබුණද, ප්‍රසම්පාදන සැලැස්මට එය ඇතුළත් කර නොතිබුණි.

### 3.5.2 අභ්‍යන්තර විගණනය

------------------------

අභ්‍යන්තර විගණන අංශයේ තථ්‍ය කාර්ය මණ්ඩලය නිලධාරීන් 04 දෙනෙකුගෙන් යුක්ත විය. අමාත්‍යාංශයේ විෂය පථය අනුව විගණන කාර්යමණ්ඩලය හා ඒකකයේ කාර්යසාධනය ප්‍රමාණවත් නොවන බව නිරීක්ෂණය විය.

### 3.6 වත්කම් කළමනාකරණය

--------------------------

අමාත්‍යාංශයේ වත්කම් සම්බන්ධයෙන් සිදුකළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

**(අ) වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පැවැත්වීම**

--------------------------------------

2014 ඔක්තෝබර් 17 දිනැති අංක 02/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව 2015 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය සිදුකර එම වාර්තා 2016 මාර්තු 17 දිනට ප්‍රථම විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, අමාත්‍යාංශය විසින් එම වාර්තා මාස 03 කට වැඩි ප්‍රමාදයකින් පසුව 2016 ජුනි 30 දින විගණනය වෙත ඉදිරිපත් කර තිබුණි.

**(ආ) බාහිර පාර්ශවයන් වෙත ලබා දී තිබුණු වත්කම්**

------------------------------------------------

අමාත්‍යාංශය සතු රු.13,152,500 ක් වූ වාහන 02 ක් සමාලෝචිත වර්ෂයේදී අග්‍රාමාත්‍ය කාර්යාලයට හා උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යාංශයට ලබාදී තිබුණි.

**(ඇ) වෙනත් ආයතන සතු වත්කම් අවිධිමත්ව පරිහරණය කිරීම**

-----------------------------------------------------------------

ජ්‍යෙෂ්ඨ අමාත්‍ය කාර්යාලය සතු වාහන 02 ක් සහ පොල් සංවර්ධන අධිකාරියට අයත් වාහනයක් ඇතුළුව එකතුව රු.60,700,000 ක්වූ වාහන 03 ක් විධිමත් පරිදි පවරා නොගෙන සමාලෝචිත වර්ෂයේදී භාවිතා කර තිබුණි.

**3.7 දේශීය මූල්‍යකරණ මගින් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2013 වර්ෂයේදී ආරම්භ කළ ද්විපාර්ශවීය විද්‍යා හා තාක්ෂණ සහයෝගිතා පර්යේෂණ ව්‍යාපෘතිය සඳහා සමාලෝචිත වර්ෂය අවසාන වන විට එකතුව රු.1,139,262 ක් වැය කර පසුව අත්හැර තිබුණි.

**(ආ)** 2013 වර්ෂයේදී ආරම්භ කර 2015 වර්ෂයේදී අවසන් කිරීමට සැලසුම් කළ ව්‍යාපෘති 02 ක් සඳහා සමාලෝචිත වර්ෂය අවසන් වන විට පිළිවෙලින් රු.3,794,385 ක් හා රු.4,828,738 ක් වැය කර තිබුණත්, නියමිත පරිදි අවසන් කිරීමට කටයුතු කර නොතිබුණි.

**3.8 කාර්යසාධනය**

2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව පිළියෙල කර තිබුණු ක්‍රියාකාරී සැලැස්ම අනුව කටයුතු කර නොතිබුණු අවස්ථා පහත පරිදි විය.

**(අ) ඉටුනොකළ ප්‍රධාන කාර්යයන්**

සමාලෝචිත වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මේ ඇතුළත් විද්‍යාතා වැඩ සටහන් 12 කින් වැඩ සටහන් 02 ක් සඳහා ප්‍රතිපාදන සලසා නොතිබුණි. සමාලෝචිත වර්ෂයේදී වැඩසටහන් 03 ක් සඳහා ප්‍රතිපාදන උපයෝජනය කර තිබුණද ප්‍රගතියක් අත් කර ගෙන නොතිබුණි. ඉතිරි වැඩ සටහන් 08 ක් සඳහා සලසා තිබුණු ප්‍රතිපාදනවලින් කිසිදු කාර්යයක් ඉටුකර නොතිබුණි.

**(ආ) ප්‍රමාණවත් ලෙස ඉටුනොකළ ප්‍රධාන කාර්යයන්**

සමාලෝචිත වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කර තිබුණු විද්‍යාතා වැඩසටහන් 09 කට අදාළ කාර්යයන් ඉටු කිරීමේදී වැඩ සටහන් 04 ක් සඳහා සලසා තිබුණු ප්‍රතිපාදනය උපයෝජනය කර තිබුණද, භෞතික කාර්යසාධනය සියයට 20 ක සිට සියයට 25 ක් අතර පරාසයක ප්‍රමාණයක් වී තිබුණි. ඉතිරි වැඩසටහන් 05 ක් සඳහා සලසා තිබුණු ප්‍රතිපාදන වලින් සියයට 35 ක සිට සියයට 75 ක් දක්වා පරාසයක ප්‍රමාණයක් උපයෝජනය කර තිබුණද, ප්‍රගතියක් අත් කරගෙන නොතිබුණි.

**3.9 අවිධිමත් ගනුදෙනු**

අමාත්‍යාංශය විසින් එළඹ තිබුණු සමහර ගනුදෙනු විධිමත් බවින් තොර විය. නිරීක්ෂණ පහත දැක්වේ.

**රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ක්‍රියා පටිපාටියෙන් බැහැරවීම**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5:3:4 (ඇ) මාර්ගෝපදේශයට පටහැනිව විද්‍යාතා මධ්‍යස්ථාන ඉදිකිරීම් කොන්ත්‍රාත්තුව සඳහා උපදේශන සේවාව සපයන ආයතනය වෙතම ඉදිකිරීම් කොන්ත්‍රාත්තුව ප්‍රදානය කර තිබුණි.

(ආ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3:4 මාර්ගෝපදේශය ප්‍රකාරව සන්දිලිපේ, සයින්දමඩු, නල්ලූර් සහ කහවත්ත යන විදාතා සම්පත් මධ්‍යස්ථාන ඉදිකිරීම් සඳහා උපදේශන සේවා ලබාගැනීමට ලංසු කැඳවීමකින් තොරව තෝරාගත් ආයතනයකට රු.544,690 ක් ගෙවා තිබුණි.

**3.10 අනාර්ථික ගනුදෙනු**

**-----------------------**

ඉදිකරණු ලබන විදාතා මධ්‍යස්ථාන 02 ක ඉදිකිරීම් ප්‍රමාද වීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේදී මධ්‍යස්ථාන සඳහා ලබාගත් ගොඩනැගිල්ලට රු.288,000 ක කුලියක් ගෙවීමට සිදු වී තිබුණි.

**3.11 කළමනාකරණ දුර්වලතා**

**--------------------------**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

**(අ)** අමාත්‍යාංශය යටතේ පිහිටුවා ඇති විද්‍යා හා තාක්ෂණ මධ්‍යස්ථාන 265 ක් අතරින් මධ්‍යස්ථාන 65 ක් අමාත්‍යාංශය විසින් ඉදිකිරීම් කළ ගොඩනැගිලිවලද, මධ්‍යස්ථාන 87 ක් ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල සහ මධ්‍යස්ථාන 113 ක් කුලී පදනම මත ලබාගත් ගොඩනැගිලිවලද, පවත්වාගෙන යනු ලබයි. ඒ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) බහුතර මධ්‍යස්ථාන සංඛ්‍යාවක් කුලී පදනම මත ලබාගත් ගොඩනැගිලිවල පවත්වාගෙන යනු ලබන අතර, 2015 වර්ෂයේදී රු.14,065,833 ක ගොඩනැගිලි කුලී ගෙවා තිබුණි.

(ii) මධ්‍යස්ථාන 265 කින් මධ්‍යස්ථාන 33 ක මධ්‍යස්ථාන භාර නිලධාරීන් වැඩ ආවරණය කිරීමේ පදනම මත පත්කර තිබුණි.

**(ආ)** විදාතා මධ්‍යස්ථාන 06 ක් ඉදිකිරීමට ආයතනයක් වෙත 2014 දෙසැම්බර් මාසයේදී රු.13,000,000 ක අත්තිකාරම් ලබාදී තිබුණද, මධ්‍යස්ථානවල ඉදිකිරීම් කටයුතු 2015 මැයි මාසයේදී ආරම්භ කර තිබුණත්, අමාත්‍යාංශය විසින් විධිමත් පරිදි පසු විපරම් කටයුතු නොකිරීම හේතුවෙන් මධ්‍යස්ථාන 02 ක ඉදිකිරීම් කටයුතු පමා කර තිබුණි.

(ඇ) විදාතා මධ්‍යස්ථාන 02 ක් ඉදිකිරීම සඳහා 2014 වර්ෂයේදී සකස් කළ ඇස්තමේන්තුව අනුව කොටසක් පමණක් ඉදිකිරීම හේතුවන් ඉතිරි කොටස නිමකිරීමට නැවත සමාලෝචිත වර්ෂයේ ඇස්තමේන්තු සකස් කිරීම නිසා මුල් ඇස්තමේන්තුව රු.2,147,294 කින් ඉක්මවා තිබුණි .

**3.14 මානව සම්පත් කළමනාකරණය**

**------------------------------------**

**(අ) අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

**------------------------------------------------------**

2015 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව | අතිරික්ත සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 23 | 20 | 3 | - |
| (ii) | තෘතීයික මට්ටම | 29 | 3 | 26 | - |
| (iii) | ද්විතීයික මට්ටම | 742 | 666 | 76 | - |
| (iv) | ප්‍රාථමික මට්ටම | 234 | 306 | 08 | 80 |
| (v) | වෙනත් (අනියම්/ තාවකාලික/ කොන්ත්‍රාත් පදනම) | 3 | 16 | - | 13 |
| | **එකතුව** | **1,031** | **1,011** | **113** | **93** |

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) ජ්‍යෙෂ්ඨ මට්ටමේ හා තෘතීයික මට්ටමේ තනතුරු 31 ක් පුරප්පාඩුව පැවති අතර, ඉන් දිස්ත්‍රික් විද්‍යාතා නිලධාරීන් 25 දෙනෙකු බඳවා ගැනීම සඳහා අනුමැතිය ලැබී තිබුණත්, බඳවා ගැනීමේ පටිපාටිය අනුමත කර නොතිබුණු හෙයින් 2016 දෙසැම්බර් මාසය වන විටත් බඳවා ගැනීමේ කටයුතු කිරීමට නොහැකි වී තිබුණි.

(ii) ද්විතීයික මට්ටම යටතේ තාවකාලිකව බඳවා ගෙන තිබුණු සංවර්ධන නිලධාරීන් 238 දෙනෙකුගෙන් 134 දෙනෙකු ස්ථිර කිරීමේදී විද්‍යා හා තාක්ෂණ නිලධාරීන් ලෙස පත්වීම් ලබා දී තිබුණි. එම හේතුවෙන් විද්‍යා හා තාක්ෂණ නිලධාරීන්ගේ අනුමත සංඛ්‍යාව 140 ක් වුවද, 274 දෙනෙකු සේවයේ නියුක්තව සිටිති. සමස්ත නිලධාරී අතිරික්තයක් පෙන්නුම් නොකළද, විද්‍යා හා තාක්ෂණ නිලධාරීන්ගේ අනුමත සීමාව ඉක්මවා 134 දෙනෙකුට පත්වීම් ලබා දී තිබුණි.

(iii) තාවකාලික සේවයේ නියුක්ත කළ මුරකරුවන් 80 ක් සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් අනුමැතිය ලබා නොගෙන 2014 නොවැම්බර් 12 දිනැති අංක 25/2014 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය යටතේ සේවයේ ස්ථිර කර තිබුණි. එම තනතුරු සඳහා 2016 දෙසැම්බර් මාසය වන විටත් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලැබී නොතිබුණි.

(iv) තාවකාලික පදනම මත සේවය කරනු ලබන සේවකයින් 16 ක් අතරින් 13 දෙනෙකු සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් අනුමැතිය ලැබී නොතිබුණි.

**(ආ) අවිධිමත් ලෙස වෙනත් පාර්ශවයන්ට නිදහස් කළ මානව සම්පත්**

විද්‍යා හා තාක්ෂණ නිලධාරීන් දෙදෙනෙකු මූලික අධ්‍යයන ආයතනයට හා අමාත්‍යාංශයකට මුදා හැර තිබුණි.